
# aat 01 විභාග ජයමග

## ව්‍යාපාරික පරිසරය

**Business Environment**






1

## 2015 සිට පැවතුන 2020 විෂය නිර්දේශයෙන් ඉවත් කරන්න ලද පාඩම්

- මෙහෙයුම් කළමනාකරණය
- මානව සම්පත් කළමනාකරණය
- ව්‍යාපාර මෙහෙයුම තුළ අලෙවිකරණයේ භූමිකාව
- තොරතුරු කළමනාකරණය
- නව සහස්‍රයේ ව්‍යාපාර අභියෝග





2

| ප්‍රධාන මාතෘකා | බර තැබීම % |
|---|---|
| ව්‍යාපාරයක සංකල්ප සහ විවිධ වර්ගවල සංවිධාන | 20 |
| ව්‍යාපාරික පරිසරය සහ ව්‍යාපාරික සංවිධාන කෙරෙහි එහි බලපෑම | 10 |
| ව්‍යාපාර සඳහා උපකාරක සේවා | 30 |
| ව්‍යාපාර සංවිධානවල වෙළෙඳාම | 10 |
| ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම් සහ ව්‍යාපාරයක් තුළ ව්‍යාපාරික ආචාර ධර්ම සහ සමාජ වගකීම් | 10 |
| ආර්ථිකයක කශේරුව ලෙස ගැනෙන කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යවසායයන් | 5 |
| ව්‍යවසායකත්වයේ දායකත්වය | 10 |
| ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ | 5 |

3

# ව්‍යාපාරික පරිසරය ප්‍රශ්ණ පත්‍රයේ සැකැස්ම

**A කොටස - ලකුණු 40 (වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)**
- වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න 10 - 20 අසයි

**B කොටස - මුළු ලකුණු 40**
- එකකට ලකුණු 10 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න 4
- කෙටි සිද්ධිදාමයක් දෙනු ලැබිය හැකිය

**C කොටස - මුළු ලකුණු 20**
- ලකුණු 20 ක එක් අනිවාර්ය ප්‍රශ්නයක්
- මධ්‍යම ප්‍රමාණයේ සිද්ධිදාමයක් දෙනු ලැබිය හැකිය

මුළු කාලය පැය 03යි

විෂයයක සාමාර්ථ ලකුණු 50 කි

4

## ව්‍යාපාරික පරිසරය ප්‍රශ්ණ පත්‍රයේ සැකැස්ම - **A** කොටස - ලකුණු 40

- ඒ කොටසේ ප්‍රශ්න විස්සක් දැකිය හැක එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ
- ප්‍රශ්න විස්සෙන් මුල් ප්‍රශ්න 10 සදහා ඔබට නිවැරදි පිළිතුරු හතරක් අතුරින් එක් පිළිතුරක් තේරීමටත්
- තවත් ප්‍රශ්න 5ක් දී ඇති ප්‍රකාශයේ සත්‍ය අසත්‍ය භාවය ලිවීමටත්
- අවසන් ප්‍රශ්න 5 කෙටි පිළිතුරු ලිවීමට ඔබට අවස්ථාව හිමි වේ

<u>හොඳ මුදලක ලක්ෂණයක් වන්නේ කුමක්ද</u>

- හඳුනාගැනීමේ පහසුව
- අනුකරණය පහසු වීම
- ඕනෑම ස්ථානයක පහසුවෙන් මුද්‍රණය කරගත හැකි වීම
- වාර්ණ සංකලනයකින් යුක්තව මුද්‍රණය කර තිබීම

ලෝකයේ සියලුම ව්‍යාපාර ලාභ අරමුණු කරගත් ව්‍යාපාර වේ

ව්‍යාපාරයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න

5

## ව්‍යාපාරික පරිසරය ප්‍රශ්ණ පත්‍රයේ සැකැස්ම - **B** කොටස - ලකුණු 40

- කෙටි සිද්ධිදාමයක් සහිත ප්‍රශ්න හතරක් දක්නට ලැබේ
- සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතුය
- එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 10 ක් හිමිවේ
- බොහෝවිට එක් ප්‍රශ්නයක් කොටස් තුනකින් සමන්විත වේ

ව්‍යාපාර උපකාර සේවාවන්, කුඩා පරිමාණ සංවිධානයන්ගේ සිට මහා පරිමාණ සංවිධානයන් දක්වා ඉතාමත් වැදගත් අංගය බවට පත්ව ඇත. ඒවා ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සඵලදායීව සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමටත්, විසඳුම් දීමටත් සංවිධානවලට සහාය වේ. මෙම උපකාරක සේවාවන්ට මුදල්, රක්ෂණය, සන්නිවේදනය, සැපයුම් සේවා සහ ප්‍රවාහනය ඇතුළත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මුදලේ කාර්යයන් (functions) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) රක්ෂණයේ මූලධර්ම දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(c) ව්‍යාපාර සංවිධානයකට රක්ෂණය වැදගත් වීමට හේතු (reasons) තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

6

## ව්‍යාපාරික පරිසරය ප්‍රශ්ණ පත්‍රයේ සැකැස්ම - C කොටස - ලකුණු 20

- මධ්‍යම ප්‍රමාණයේ සිද්ධිදාමයක් සහිත එක් ප්‍රශ්න දක්නට ලැබේ
- එම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමිවේ

**සීමාසහිත Refresh සමාගම** සතුව බස්නාහිර පලාත තුළ අලෙවිසැල් 40 කින් යුත් සුපිරි වෙළෙඳසැල් දාමයක් තිබේ. මෙම අලෙවිසැල් මගින් නැවුම් එළවළු සහ පලතුරු මෙන්ම සීඝ්‍රයෙන් අලෙවි වන භාණ්ඩ (FMCG) අලෙවි කරනු ලබයි. සමාගමට මධ්‍යම පලාතේ අක්කර තුනක ගොවිපොළවල් ඇති අතර, එම ගොවිපොළවල්වල සිට බස්නාහිර පලාතේ ඇති අලෙවිසැල් 40 ට එහි නිෂ්පාදිත බෙදාහරිනු ලබයි. **සීමාසහිත Refresh සමාගමේ** සුපිරි වෙළෙඳසැල් සමූහය මගින් ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා තෘප්තිමත් කිරීම තහවුරු කිරීම පිණිස දේශීය සහ විදේශීය වෙළෙඳ සන්නාම යටතේ ඇති භාණ්ඩ (branded goods) අලෙවි කරනු ලබයි. **සීමාසහිත Refresh සමාගමේ** බහුතරයක් ගෙවීම් චෙක්පත් මගින් සිදුකරයි.

**සීමාසහිත Refresh සමාගම,** තමන්ගේම ප්‍රවාහන සේවයක් පවත්වා නොගන්නා අතර, ඒ වෙනුවට අන්තර්ජාල යෙදවුමක් හරහා නැවුම් එළවළු සහ පලතුරු ප්‍රවාහනයට අවශ්‍යවන වාහන කුලී පදනම මත ලබාගනී. මෙම ක්‍රියා පටිපාටිය ආයතනයේ ප්‍රවාහන පිරිවැය අවම කිරීමට හේතුවනු ඇති බවට එහි කළමනාකාරිත්වය අදහස් කරයි. නමුත් බොහෝ අවස්ථාවන්හිදී මෙම බාහිරින් ලබාගත් බෙදාහැරීමේ රියැදුරන්ගේ සේවය ගුණාත්මක බවින් අඩු බවට අලෙවිසැල් කළමනාකරුවන් විසින් චෝදනා කරනු ලැබේ. මෙම දුර්වල ප්‍රවාහන ක්‍රමවේදය හේතුවෙන් එළවළු සහ පලතුරු අපතේ යාම් සමාගමේ ඉතා විශාල පිරිවැයක් බවට මෑත වර්ෂවලදී පත්ව ඇත. එමනිසා ආයතනයේ කළමනාකරණය එළවළු හා පලතුරු ප්‍රවාහනය සඳහා නව බෙදාහැරීමේ රථ දෙකක් මිලට ගැනීමට සැලසුම් කරමින් සිටී.

**සීමාසහිත Refresh සමාගමේ** සියලුම මුදල් අයකැමිවරුන් හරපත් සහ බැරපත් ගෙවීම් බාර ගැනීමට අවශ්‍ය ස්වයිප් යන්ත්‍ර (swipe machines) වලින් සන්නද්ධව සිටී. කොවිඩ්-19 (COVID-19) වසංගත තත්ත්වයත් සමඟ, සමාගමේ වෙබ් අඩවිය මාර්ගගත ගෙවීම් පහසුකම් සහිතව සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීමට කළමනාකාරිත්වය සැලසුම්කොට ඇත. මෙමගින් සමාගමේ සියළුම අලෙවිසැල්වලට එකිනෙක සමඟ ජාලගතවීමට සහ ඔවුන්ගේ ව්‍යාපාරික මෙහෙයුම්වලදී විද්‍යුත් සන්නිවේදන විකල්ප භාවිත කිරීමට හැකියාව ලැබෙනු ඇත. සමාගමට අළුතින් බඳවාගත් තොරතුරු තාක්ෂණ කළමනාකරු (IT manager) විසින් සියලුම සැපයුම් දාම ක්‍රියාකාරකම් (supply chain activities), ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් (ERP system) හරහා සැලසුම් කොට ඇති වෙබ් අඩවිය හා ඒකාබද්ධ කිරීමට සැලසුම් කරමින් සිටී.

7


## ප්‍රශ්න පත්‍ර විශ්ලේෂණය 2020 ජුලි / 2021 ජනවාරි



8

## A කොටස - ප්‍රශ්න 20, 2020 ජූලි / 2021 ජනවාරි බෙදීගිය අයුරු

| පාඩම | 2020 ජූලි | 2021 ජනවාරි |
|---|---|---|
| 1 | 4 | 10 |
| 2 | 2 | |
| 3 | 9 | 5 |
| 4 | 1 | |
| 5 | 2 | 4 |
| 6 | 1 | 1 |
| 7 | 1 | |
| 8 | | |




9

## B ,C කොටසේ ප්‍රශ්න - 2020 ජූලි / 2021 ජනවාරි බෙදීගිය අයුරු

| ප්‍රශ්න | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| B 2 | a | | b,c | | | | | |
| B 3 | c | | | a,b | | | | |
| B 4 | | | | | | c | a,b | |
| B 5 | | a | | | b,c | | | |
| C 6 | a,b | c | d | e | | | | |
| **ප්‍රශ්න** | **1** | **2** | **3** | **4** | **5** | **6** | **7** | **8** |
| B 2 | | | a,b,c | | | | | |
| B 3 | | | | a,b,c | | | | |
| B 4 | | | | | | | a,b | |
| B 5 | | a,b | | | | c | | |
| C 6 | | | b,c,d,e | a | | | | |

10

## A,B,C කොටස - 2020 ජුලි ප්‍රශ්න බෙදීගිය අයුරු

| ප්‍රශ්න | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| B 2 | a | | b,c | | | | | |
| B 3 | c | | | a,b | | | | |
| B 4 | | | | | | c | a,b | |
| B 5 | | a | | | b,c | | | |
| C 6 | a,b | c | d | e | | | | |

| ප්‍රශ්න | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| A | 4 | 2 | 9 | 1 | 2 | 1 | 1 | |

| බර තැබීම | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| | 20% | 10% | 30% | 10% | 10% | 5% | 10% | 5% |

11

## A,B ,C 2021 ජනවාරි ප්‍රශ්න බෙදීගිය අයුරු

| ප්‍රශ්න | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| B 2 | | | a,b,c | | | | | |
| B 3 | | | | a,b,c | | | | |
| B 4 | | | | | | | a,b | |
| B 5 | | a,b | | | | c | | |
| C 6 | | | b,c,d,e | a | | | | |

| ප්‍රශ්න | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| A | 10 | | 5 | | 4 | 1 | | |

| බර තැබීම | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| | 20% | 10% | 30% | 10% | 10% | 5% | 10% | 5% |

12




13